සහජ දක්ෂතාවක් පෙන්නුම් කළේ ය. කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, සහ විවෘත විශ්ව විද්‍යාල තුළ ජනමාධ්‍ය පිළිබඳ බාහිර උපදේශයකු වශයෙන් ද කටයුතු කළේ ය.

2002 මැයි මස 13 වන දින අප විසින් ආරම්භ කර තිබූ වැදගත් සාකච්ඡා වටයට පැමිණෙන ලෙස එච්.එම්. දුරකථන ඇමතුමක් දුන්නේ මැයි මාසයේ 07 වනද උදෑසන ය. පසුගිය මාස දෙකක පමණ කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවට ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳ වැදගත් කාර්යයට මූලිකත්වය දුන්නේ එතුමා ය.

විනිසුරු රාමනාදන්, පාක්‍යමුත්තු, සරවනමුත්තු, රොහාන් එදිරිසිංහ, ජී.එම්.ජී.එදිරිසිංහ, වික්ටර් ගුණවර්ධන, බර්ටි ගලහිටියාව, ඩිව් ගුණසේකර, පියදාස රත්නසිංහ, බර්ටි ජයසේකර,ජයසුමන දිසානායක හා තවත් කිහිප පලක් සම්බන්ධ කරගෙන දින හතරක් තිස්සේ පැවැත්වූ සාකච්ඡා වටවල අවසාන සාකච්ඡාව යොදාගෙන තිබුණේ මැයි 13 දාට ය. එම ප්‍රතිපත්ති මාලාව පිළියෙල කර අදාළ බලධාරීන්ට යොමුකිරීමේ අවශ්‍යතාව නිරන්තරයෙන් ම අවධාරණය කළ ඔහුට එය ඉටුකිරීමට නොහැකි විය.

පසුගිය සිකුරාදා උදේ රෂියා (එච්.එම්.ගේ ලේකම්වරිය) කියා සිටියේ මැයි 13 දින රැස්වීම කල් දමන්නට සිදුවූ බව ය. මම හේතුව ඇසීමි. "එච්.එම්.ට අසනීපයි I CU එකේ දැන් ටිකක් හොඳයි " කියා ඇය පැවසුවා ය.

ඔහුගේ සද් කාර්යය අවසන් වනු දක්නට ඔහුට හැකි නොවිනි. එහෙත් කෙසේ හෝ එය අවසන් කොට මේ රටේ සාධාරණ ජනමාධ්‍යය (විද්‍යුත්) ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට හැකි වූ දවසක අප එච්.එම්.ට සැලකුවා වේ. හිතවතෙක් හොඳ සහෘදයෙක් ජාතියට ම අහිමි විය. ❑

**පියදාස රත්නසිංහ**
**රූපවාහිනී සංස්ථාවේ**
**හිටපු අධ්‍යක්ෂ ජනරාල්,**
**ටෙලිවිෂන් පෞද්ගලික සමාගමේ**
**ජාත්‍යන්තර අංශයේ**
**සාමාන්‍යාධිකාරී සහ ටෙලිවිෂන්**
**තාක්ෂණ විද්‍යා ඇකඩමියේ**
**පාඨමාලා අධ්‍යක්ෂ.**

**නව නිපැයුම්**

# ජගත් ජය දිදී නැංවූ අපේ නව නිපැයුම්

නව නිර්මාණකරණයෙ හි නිරත නිර්මාණශීලි පුද්ගලයා මුළු විශ්වයට ම පොදු වූ වස්තුවකි. ඔහු විසින් නිර්මාණය කරන නව නිර්මාණය සමස්ත විශ්වයට ම පොදු වූ දෙයකි. එය සමස්ත ජනතාවගේ ම අවශ්‍යතාවක් විය හැකි ය. එහෙයින් ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් ශ්‍රී ලංකාවට පමණක් නොව සමස්ත ලෝකයට ම පොදු වූ වස්තුවක් බවට පත් වී ඇත. ඔවුන් දිරිමත් කිරීමත්, උපකාර කිරීමත් තුළින් ශ්‍රී ලංකාව තුළ සිටින නිර්මාණශීලි පුද්ගලයන් හා ඔවුන්ගේ නිර්මාණ තම රටේ සංවර්ධනය සඳහා යොද ගැනීමට උත්සාහ ගත යුතු යි. ආර්ථික විශේෂඥයන් කර්මාන්තකරුවන් හා ආයෝජකයන් දේශීය වශයෙන් නිර්මාණය වන නව නිපැයුම් පිළිබඳව වැඩි අවධානය යොමු කළ යුතු යි. දැනට ලංකාව තුළ බිහි වී ඇති නිව නිපැයුම් හා ඒවා දැනට කොපමණ ප්‍රමාණයක් රටේ ආර්ථික සංවර්ධනයට දායක කර තිබේද යන්න අප විමසිල්ලෙන් බැලිය යුතු



පාදුක්ක සිරි පියරතන මධ්‍යමහා විද්‍යාලයේ ඉගෙනුම ලබන තුෂාන් ජීවන්ත වේරගල මහතා නිපද වූ කාසි ගණින යන්ත්‍රය වෙළඳ ඇමති රවි කරුණානායක මහතාට පෙන්වූ අවස්ථාව. මෙයට රන් පදක්කමක් සහ සහතිකයක් හිමි විය.

කරුණක්. ශ්‍රී ලංකාව තුළ දේශීය දේ අගය කිරීමත් ඉන් ප්‍රයෝජන ගැනීමත් පවතින්නේ දුර්වල මට්ටමක ය. දේශීය නව නිර්මාණ ඇගයීමට ලක් නොවන්නේ ද මේ නිසා ය.

මේ හේතුව නිසාම බිහි වූ ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසම දැන් වාර්ෂිකව ප්‍රදර්ශන හා තරග ඉදිරිපත් කරනු ලබයි. මෙසේ විශේෂ නිර්නායකයන් මගින් තෝරාගනු ලබන නව නිපැයුම් කරුවන් ජාත්‍යන්තර තරග සඳහා ද ඉදිරිපත් කරයි. මෙම වැඩසටහන යටතේ 1996 වසරේ සිට 2002 වසර දක්වා නව නිපැයුම් 27 ක් මෙම ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීමට කොමිසම කටයුතු කර ඇත.



ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලයේ විදුහල්පති ඩබ්. විමලසිරි මහතා නිපද වූ අඩු වියදම් ආරක්ෂිත කුප්පිය අතැතිව. මෙයට(WIPO)සංවිධාන රන් පදක්කම සහ ඇමරිකානු ඩොලර් 2000 ක විශේෂ මුදල් ත්‍යාගයක් ද හිමි විය.

සෑම වසරක දී ම ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර දී පවත්වනු ලබන මෙම ප්‍රදර්ශනය නව නිපැයුම් කරුවන්ගේ ජාත්‍යන්තර සංවිධානය(IFIA)හා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය(WIPO)මගින් සංවිධානය කරනු ලබයි. මෙම ප්‍රදර්ශනය පැවැත්වීමේ පරමාර්ථ කිහිපයකි.

එනම්,

1. ලෝකයේ ම නව නිපැයුම්කරුවන් හා නිර්මාණකරණය ප්‍රවර්ධනය කිරීම

2. නව නිපැයුම් කරුවන්ට සිය නව නිපැයුම් සඳහා වෙළෙඳ පොළක් ලබා ගැනීමට අවස්ථාව සලසාදීම



නර්ඩ් ආයතනයේ ඩී.එම්. පුංචිබණ්ඩා මහතා නිපද වූ දර වායු ලිප පිළිබඳ විස්තරයක් කරමින්. මෙයට රිදී පදක්කමක් සහ සහතිකයක් හිමි විය.



නර්ඩ් මධ්‍යස්ථානයේ මාලිනී කුමාරි රණතුංග මහත්මිය අඩු වියදම්, ඉතා හොඳ තත්ත්වයේ තෙල් සිදීම පිළිබඳව ඉදිරිපත් කළ උපකරණය. මෙයට රිදී පදක්කමක් සහ සහතිකයක් හිමි විය.

3. නව නිපැයුම්කරුවන් හා නව නිපැයුම් හඳුනා ගැනීම.

4. නව නිපැයුම් වාණිජකරණය සඳහා ප්‍රසිද්ධියක් ලබාදීම යි.

මෙහි දී, සංවර්ධිත රටවල්, කාර්මික රටවල් මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ද විවිධ අංශවලින් නව නිපැයුම් ඉදිරිපත් කෙරේ.

අන්තර්ජාතික විනිශ්චය මණ්ඩලයක් මගින් විනිශ්චය කරනු ලබන මෙම තරගය හා ප්‍රදර්ශනය තුළින් තාක්ෂණික අංශ කිහිපයකින් නව නිපැයුම් තෝරා ගනු ලබයි. එසේ තෝරා ගන්නා ලද සියලුම නව නිපැයුම් සඳහා රන් පදක්කම්, රන් ආලේපිත රිදී පදක්කම්, රිදී පදක්කම් හා ලෝකඩ පදක්කම් සහතික සහ විවිධ අවස්ථාවන් හි දී මුදල් ත්‍යාග ද පිරි නැමේ. මෙවන් පසුබිමක් යටතේ ඉදිරිපත් වූ 30 වන ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනයට ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් නව දෙනෙකු නව නිපැයුම් 7 ක් ඉදිරිපත් කර ඇත.

තුෂාන් ජීවන්ත වේරගල කාසි ගණින යන්ත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් රන්පදක්කමක් සහ සහතිකයක් ද, සජීව උදයංග පෙරේරා මෝටර් රථ වාහන සොරුන්ගෙන් ආරක්ෂාකර ගැනීමේ උපකරණයක් ඉදිරිපත් කිරීමෙන් ලෝකඩ පදක්කමක් සහ සහතිකයක් ද, අයල් තිලූක හේරත් ගැටකපන්නන්ගෙන් ආරක්ෂා කර ගත හැකි මුදල් පසුම්බියක් ඉදිරිපත් කිරීමෙන් ලෝකඩ පදක්කමක් සහ. සහතිකයක් ද, ඩබ්.ඩබ්. අල්විස් ආරක්ෂිත භූමිතෙල් ලාම්පුව ඉදිරිපත් කිරීමෙන් ලෝක බුද්ධිමය දේපළ සංවිධානය මගින් ප්‍රදානය කරනු ලබන සංවර්ධනය වන රටවල හොඳම නිපැයුම සඳහා වන රන් පදක්කම, සහතිකයක් සහ ඇමරිකානු ඩොලර් 2000 ක විශේෂ මුදල් ත්‍යාගයක් ද, ටී.එම්. පුංචිබංඩා දුම් රහිත දර වායු ලිප ඉදිරිපත් කිරීමෙන් රිදී පදක්කමක් සහ සහතිකයක්ද, වයි.එම්.එම්. කේ. රණතුංග තෙල් සිදින කුඩා යන්ත්‍රය ඉදිරිපත් කිරීමෙන් රිදී පදක්කමක් සහ සහතිකයක්ද, එම් හුසේන් ජිෆ්රි, ආර්.එල්.එස්. නානායක්කාර, එම්.ඒ.ඩී. සුදර්ශන පෙරේරා යන අය නවීකරණය කරන ලද බයිසිකලය ඉදිරිපත් කිරීමෙන් ලෝකඩ පදක්කමක් සහ සහතිකයක් ද ලබා 30 වන ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනය සඳහා කොමිසම විසින් ඉදිරිපත් කළ සියලුම නව නිපැයුම් සඳහා ජයග්‍රහණ හිමි කර ගත්හ. එසේම 1996 සිට මෙතෙක් අප ලද ජයග්‍රහණ අතරට විශේෂ ජයග්‍රහණයක් මෙහිදී ලබා ගැනීමට හැකිවීම විශේෂ සිද්ධියකි. ආරක්ෂිත කුප්පි ලාම්පුව සඳහා ඇමරිකානු ඩොලර් 2000 ක විශේෂ මුදල් ත්‍යාගය ලැබීම එම ජයග්‍රහණයයි. ❑

**ඉන්දික කුඩාහෙට්ටි**

ඡායාරූප - **බර්ටි වීරසිංහ**



ලෝකඩ පදක්කමක් සහ සහතිකයක් ලබාගත් හසන් ජෙෆ්රි, ආර්.එල්.එස්. නානායක්කාර හා සුදර්ශන පෙරේරා යන මහතුන් නවීකරණය කරන ලද බයිසිකලය වෙළෙඳ ඇමති රවි කරුණානායක මහතාට පෙන්වන අවස්ථාවක්



මාවනැල්ල මයුරපාද ජාතික පාසලේ අයල් තිලූක හේරත් මහතා නිපද වූ සොරාගත නොහැකි මුදල් පසුම්බිය අතැතිව. මෙයට ලෝකඩ පදක්කමක් සහ සහතිකයක් හිමි විය.